සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 09 - 2023**

## ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න.

(01) දේව මැවිල්ල පිළිබඳ ව ශුද්ධ බයිබලයේ සඳහන් ග්‍රන්ථය කුමක් ද?
(i) නික්මයාම ය. (ii) උත්පත්ති ය. (iii) ජොහාන් ය. (iv) එළිදරව්ව ය.

(02) දාවිත් රජුට ඊර්ෂයා කළ රජතුමා කවුරුන් ද?
(i) සාවුල් ය (ii) ජොනතන් ය (iii) මෝසෙස් ය (iv) ජාකොබ් ය

(03) නෝවා දෙවිඳුන් ඉදිරියේ,
(i) ප්‍රේමයෙන් ජීවත් විය. (ii) ධර්මිෂ්ඨව ජීවත් විය.
(iii) බෙදා හදාගෙන ජීවත් විය. (iv) ප්‍රීතියෙන් ජීවත් විය.

(04) කිතුනු අපගේ විශ්වාසයේ කර්තෘ වන්නේ කවුරුන් ද?
(i) ජේසුස් වහන්සේ ය. (ii) දෙවියන් වහන්සේ ය.
(iii) ආදම් සහ ඒව ය. (iv) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

(05) එලියා දිවැසිවරයා පෝෂණය ලැබුවේ කාගෙන් ද?
(i) සමාරියේ ස්ත්‍රියගෙන් ය. (ii) නායින් නුවර වැන්ඹුවගෙන් ය.
(iii) ගාබ්‍රියෙල් දේව දූතයාගෙන් ය. (iv) ශාරපෙත් හි වැන්ඹුවගෙන් ය.

(06) රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා රෝගාතුරව සිටියේ කොහේ ද?
(i) බෙතානියේ ය. (ii) නාසරතයේ ය. (iii) කපර්ණමුවෙහි ය. (iv) තාර්සස්හි ය.

(07) ජුදා ජන ජීවිතයේ අතිශය වැදගත් දිනය වන්නේ කවදා ද?
(i) පාස්කු දිනය යි. (ii) ස්වර්ගාරෝහණ දිනය යි.
(iii) පෙන්තකොස්ත දිනය යි. (iv) සබත් දිනය යි.

(08) ''ශුද්ධාත්ම බලයෙන් පූර්ණ ව .............................. විසින් බොහෝ හාස්කම් සිදු කරන ලදී''. මෙහි හිස්තැනට සුදුසු වචනය කුමක් ද?
(i) ප්‍රේරිතයන් (ii) මරියතුමිය ය. (iii) ලාසරස් ය. (iv) පරිසිවරුන් ය.

(09) ''තබීතා'' යන්නෙහි අර්ථය කුමක් ද?
(i) සිංහ ධේනුව ය. (ii) කාන්තාව ය. (iii) වැන්දඹුව ය. (iv) මුව දෙන ය.

(10) ශ්‍රාවකයන් ට ශුද්ධාත්ම දානය ලැබුනේ කවදා ද?
(i) මහා සිකුරාදා ය. (ii) පෙන්තකොස්ත දින ය.
(iii) සබත් දිනය ය. (iv) මහා බ්‍රහස්පතින්දා දිනය ය.

(11) අප සියලු ම දෙනාගේ ගැලවීම උදෙසා ජීවමාන පූජා යාගයක් ලෙස පූජා වූයේ කවුරුන් ද?

(i) දෙවියන් වහන්සේ ය. (ii) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.
(iii) ජේසුස් වහන්සේ ය. (iv) පාවුල් තුමා ය.

(12) ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැක බලා ගැනීමේ වගකීම දැරූ පුද්ගලයා කවුරුන් ද?

(i) සාවුල් ය. (ii) මෝසෙස් ය. (iii) දාවිත් ය. (iv) ජොහාන් ය.

(13) ''රන් වන් රිදීවත් මට නැත, එහෙත් මට ඇති දේ ඔබට දෙමි'' මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(i) ලූක් ය. (ii) ජුදස් ය. (iii) මතෙව් ය. (iv) පේදුරු ය.

(14) මෙපිබෝෂෙත් ව ආදරයෙන් රැක බලා ගත්තේ කවුරුන් ද?

(i) නෝවා ය. (ii) සාවුල් ය. (iii) එලියා ය. (iv) දාවිත් ය.

(15) දෙවියන් වහන්සේ මිනිසාට අනාවරණය වන ප්‍රබලත ම මාර්ගය වන්නේ කුමක් ද?

(i) දේව වචනය යි. (ii) යාච්ඤාවයි. (iii) ගීතිකාවයි. (iv) දිව්‍ය පූජාවයි.

(16) පාවුල් තුමා එජීස ලිපිය ලියනු ලැබුවේ කොහේ දී ද?

(i) දේව මාලිගයේ දී ය. (ii) උත්තම පූජක මැදුරේ දී ය.
(iii) තම නිවසේදී ය. (iv) සිර මැදුරේදී ය.

(17) තමකම නැසීම පිළිබඳව අප වෙත මහගු ආදර්ශයක් ලබා දුන්නේ කවුද?

(i) දෙවියන් වහන්සේ ය. (ii) ආදම් ය.
(iii) ජේසුස් වහන්සේ ය. (iv) ආබ්‍රහම් ය.

(18) කිතුනු අපගේ සන්නාහ සන්නද්ධ ආයුධවල දී ''ගැලවීම'' සමාන කරනුයේ කුමකටද?,

(i) හිස් වැසුමට ය. (ii) පලිහට ය. (iii) වහන්වලට ය. (iv) ඉඟ පටියට ය.

(19) කිතුනු දරුවකු ලෙස අප තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(i) සමාව දීම ය. (ii) අලසකම ය. (iii) පරාර්ථකාමී බව ය. (iv) කාරුණික බව ය.

(20) නව යොවුන් වියේ සිටින ඔබ සැම විටම,

(i) ඔබ කැමති දේ කළ යුතුය. (ii) සමාජය කැමති දේ කළ යුතුය.
(iii) මිතුරන් කැමති දේ කළ යුතුය. (iv) දේව කැමැත්තට ඉඩ දිය යුතුය.

## II - කොටස

● පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02 ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ සිදු කළ පළමු ප්‍රාතිහාර්ය කුමක් ද? එය සිදු කළේ කොහේදී ද?

(iii) කිතුනුවකු වන අප සන්නාහ සන්නද්ධ විය යුතු යුද්ධායුධ 02 ක් ලියන්න.

(iv) ශුද්ධ වූ පාවුල් තුමා විසින් ලියන ලද ලිපි 2 ක් ලියන්න.

(v) මුල් කිතුනු සභාවට පීඩා එල්ල කළ කණ්ඩායම් 2 ක් ලියන්න.

(vi) ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වීමට සපුරා ලිය යුතු ගුණාංග 2 ක් ලියන්න. (මතෙව් 16 : 24 ට අනුව)

(vii) ක්‍රිස්තුස් වහන්සේ තුළ නව ජීවිතයක් අත් කර ගැනීමට අවශ්‍යය ගුණාංග 2 ක් නම් කරන්න.

(viii) හාරදහසකට (4000) කෑම දීමේ ප්‍රාතිහාර්ය සඳහා ජේසුස් වහන්සේ යොදා ගත්තේ මොනවා ද?

(ලකුණු 2 × 8 = 16)

(02) (i) දාවිත් රජුගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 2 ක් ලියන්න.

(ii) දාවිත් රජුගේ දිවියෙන් ඔබේ දිවියට ලැබෙන ආදර්ශ 03 ක් ලියන්න.

(iii) ඔබ පංති කාමරයේ විශේෂ අවශ්‍යතා ඇති මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 03 ක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(03) (i) ''ඔබේ වචන මාගේ දෙපයට ............................ මාගේ මාවතට ..............'' මෙහි හිස්තැන්වලට සුදුසු වචන යොදා බයිබල් පාඨය සම්පූර්ණ කරන්න.

(ii) දේව වචනය අවබෝධ කර ගැනීම සඳහා ඔබට මඟ පෙන්වන පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.

(iii) දේව වචනය කියවීම තුළින් ඔබේ දිවියට ලැබෙන ආලෝකය කෙසේ ද? කරුණු තුනක් ලියා පහදන්න.

(ලකුණු 2+3+6 = 11)

(04) (i) ශුද්ධ වූ පාවුල් තුමා සිරභාරයට ගනු ලැබුවේ මන්ද?.

(ii) අද සමාජය තුළ නපුරු බලවේග පැමිණෙන ස්වරූප 3 ක් ලියන්න.

(iii) ජේසුස් වහන්සේගේ යුධ සෙබලෙකු ලෙස කිතුනු ඔබ මෙහෙවරෙහි යෙදෙන්නේ කෙසේදැයි කරුණු තුනක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(05) (i) එදිනෙදා දිවියේදී අපට මුහුණ දීමට සිදුවන ස්වභාවික ව්‍යසනවලට උදාහරණ 02 ක් ලියන්න.

(ii) දෙවියන් වහන්සේ අඳුර මැදින් අපගේ බිය දුරුකරන අවස්ථා සඳහා උදාහරණ 03 ක් ලියන්න.

(iii) දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ගනිමින් ඔබගේ ජීවිතයට ආ පීඩාවන් ජයගත් අවස්ථාවක් විස්තර කරන්න.

(ලකුණු 2+3+6 = 11)

(06) (i) ජේසුස් වහන්සේ ව අනුගාමී වන්නන් සමාන කරන්නේ කාට ද?

(ii) මිනිසා තමන් පිළිබඳව ඉහළින් සිතනා කරුණු 03 ක් ලියන්න.

(iii) ආධ්‍යාත්මික ලෙස නව ජීවිතයක් කරා යොමු වීමට නම් කිතුනු දරුවෙකු තුළ තිබිය යුතු ගුණාංග 6 ක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(07) (i) ක්‍රිස්තුස් වහන්සේ තම ශ්‍රාවකයන්ව කැඳවන ලැබුවේ කුමක් සඳහා ද?

(ii) ගරු ජේම්ස් එම්. ඩැරල් දේවගැති තුමා විසින් සිදු කළ විශේෂ සේවාව කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) ක්‍රිස්තුස් වහන්සේට අයත් වූවෙකු ලෙස තමකම නසමින් අන් අය වෙනුවෙන් වැය වීමට පාසල් දරුවෙකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න.

(ලකුණු 2+3+6 = 11)

(4) www.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

(4) WWW.PastPapers.WiKi (4)

Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## ක්‍රිස්තු ධර්මය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | |
|---|---|---|---|
| (01) - (ii) | (06) - (iii) | (11) - (iii) | (16) - (iv) |
| (02) - (i) | (07) - (iv) | (12) - (i) | (17) - (iii) |
| (03) - (ii) | (08) - (i) | (13) - (iv) | (18) - (i) |
| (04) - (ii) | (09) - (iv) | (14) - (iv) | (19) - (ii) |
| (05) - (iv) | (10) - (ii) | (15) - (i) | (20) - (iv) |

(ලකුණු 2 × 20 = 40)

### II - කොටස

(01) (i) ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙර, ප්‍රාතිහාර්ය සිදු කිරීමට පෙර, මෙහෙය ඇරඹීමට පෙර, දුක් ප්‍රාප්තියට පෙර.

(ii) වතුර මිදි යුෂ බවට පත් කිරීම - කානා නුවරදී

(iii) සත්‍යය, දමිටුතම, ඇදහිල්ල, සාම සුබ අස්ත, ගැලවීම

(iv) එපිස, කොරෙන්ති, ගලාති ආදි පාවුල් තුමාගේ හසුන්වලින් 02 ක්

(v) අන්තවාදී අදහස් දැරූ ජුදෙව්වන්ගෙන්, රෝම අධිරාජ්‍යයේ

(vi) තමකම නැසීම, කුරුසිය දැරීම හා උන් වහන්සේ පසු පස යාම

(vii) දමිටුකම, ශුද්ධවන්තකම

(viii) රොටී හතක් (7) හා මසුන් ස්වල්පයක් (ලකුණු 2 × 8 = 16)

(02) (i) එන්ගෙදියේ දී සාවුල්ගේ ජීවිතය මිදීම.
මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.

(ii) දේව භය ඇතිව ක්‍රියා කිරීම, යටහත් පහත් බව, ප්‍රේමයෙන් ක්‍රියා කිරීම
දැහැමි ජීවිතය (පෙළ පොතේ පිටු අංක 07)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න (ලකුණු 2+3+6 = 11)

(03) (i) "ඔබේ වචන මාගේ දෙපයට <u>පහනක්</u> ය. මාගේ මාවතට <u>එළියක්</u> ය."

(ii) පූජක තුමන් ලා, ගුරුභවතුන්, දෙමාපියන්, වැඩිහිටියන් ආදී වූ පිළිතුරු

(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+3+6 = 11)

(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

(04) (i) සුබාරංචිය ප්‍රකාශ කළ නිසා

(ii) සමහර මිතුරන් මගින් පැමිණෙන වැරදි පෙළඹවීම, නවීන සන්නිවේදන උපකරණ වැරදි ලෙස භාවිතය, මත් ද්‍රව්‍ය, දුම්වැටි දේ කෙරෙහි පෙළඹවීම, ගුරු දෙගුරුන්ගේ උපදෙස් පිළිපැදීමට දක්වන මැලිකම (පිටු අංක77)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6 = 11)

(05) (i) ගංවතුර, නාය යෑම, නියඟ, සුළි සුළං, වසංගත ආදිය

(ii) අසාධ්‍ය ලෙඩ රෝග, සතුරු කරදර, අසත්‍ය චෝදනා

(iii) සිසුවා ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න

(ලකුණු 2+3+6 = 11)

(06) (i) එඬේරෙකු පසු පස යන බැටළුවන් ට

(ii) තම බලය, තම හැකියා, තම රූප ස්වභාවය, තමා සතු ධනය, තම බුද්ධිය, තමන් දරන තනතුරු

(iii) සිසුවා ලියා ඇති පිළිතුරුවලට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6 = 11)

(07) (i) ජේසුස් වහන්සේගේ ජීවිතාදර්ශය මත පිහිටා දේව රාජ්‍යය බිහි කිරීමට

(ii) උණ සන්නිපාතය වැළඳුණු සිසුන්ට උපස්ථාන කිරීමේ සිදුවීම (පෙළ පොත් පිටු අංක 70 - 71)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරුවලට අනුව ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+6 = 11)

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න